අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/28/02/03

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.06. 22

චක්‍රලේඛ අංක: **24/2024**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම පාසල්වල විදුහල්පතිවරුන් වෙත,

**"කර්මාන්ත ව්‍යවසායකත්ව කව" වැඩසටහන පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීම**

අධ්‍යාපන අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය හා ලංකා කර්මාන්ත සංවර්ධන මණ්ඩලය එක්ව මෙරට කර්මාන්ත ක්ෂේත්‍රයෙහි ප්‍රවර්ධනය හා අපනයන කේන්ද්‍රිය නිෂ්පාදන ආර්ථික ප්‍රවර්ධනය අරමුණු කරගනිමින් 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසුන්ට සාමාජිකත්වය ලබාගත හැකි ශිෂ්‍ය සංගමයක් ලෙස "කර්මාන්ත ව්‍යවසායකත්ව කව" පාසල් තුළ ආරම්භ කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

වර්තමාන ශ්‍රී ලංකාවට අත්විදීමට සිදුව ඇති සමාජ , ආර්ථික ගැටලු සඳහා අධ්‍යාපන ක්‍රියාවලිය තුළින් විසඳුම් සෙවීමට කටයුතු කළ යුතුව ඇත. රටෙහි අනාගත සුරක්ෂිතතාවය සහ අභිවෘද්ධිය වෙනුවෙන් සිසු දරුවන් ශක්තිමත් සහ නිපුණ මානව සම්පතක් ලෙස ගොඩනැගීම උදෙසා ඔවුන් ව්‍යවසායකත්වයට යොමු කිරීම දුරදර්ශී විසඳුමකි. එය ප්‍රධාන පරමාර්ථය කරගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම අප සියලු දෙනාගේ වගකීමකි.

**1. ව්‍යවසායකත්ව කව හැඳින්වීම**

ව්‍යවසායක කවයක් යනු, ව්‍යවසායක නියමුවන්ගේ එකතුවකි. ව්‍යවසායක නියමුවන් යනු, රටේ කර්මාන්ත අංශය දියුණු කිරීම තුළින් රට සංවර්ධනය කිරීම කළ හැකි බවට විශ්වාසයෙන් යුතුව කටයුතු කරන, අවදානම් දැරීමට හැකියාවක් ඇති, භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය යන සම්පත් මනාව හැසිරවීමට රුචිකත්වයක් දක්වන, ඒ සඳහා කැපවෙන කණ්ඩායමක් වේ. මෙම ව්‍යවසායක නියමුවන් එකතු වී කවයක් ලෙස කටයුතු කිරීමෙන්, ඔවුනොවුන්ගේ අදහස් හුවමාරු කර ගැනීම, ප්‍රශ්නවලට සාමූහිකව විසඳුම් සෙවීම, ව්‍යවසායකත්ව පෞරුෂය ගොඩනැගීම සඳහා ශක්තිමත් පවුරක් ලෙස කටයුතු කිරීමේ හැකියාව ඇති වේ.

මෙරට, පාසල් අධ්‍යාපනයේ දී විවිධ විෂයන් හදාරන සිසුන්ට ව්‍යවසායකත්වය සම්බන්ධ මූලික ප්‍රායෝගික අත්දැකීම් විධිමත්ව අත්පත් කර ගැනීමට අවකාශ ලබා දීම තුළින්, පාසල් අධ්‍යාපනයෙන් පසු ඵලදායී ආර්ථික කටයුත්තක නිරත වීමට විධිමත් අධ්‍යාපනය තුළින්ම යම් අත්දැකීමක් ලබා දීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් ය. එමගින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා අවශ්‍ය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය ඵලදායී ලෙස දියුණු කිරීමේ අරමුණ ද සාක්ෂාත් කරගත හැකි වේ.



ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

Scanned with CamScanner

**2. කර්මාන්ත ව්‍යවසායකත්ව කව පිහිටුවීමේ අරමුණු**

I. ජාතික නිෂ්පාදනයට ක්‍රියාශීලිව හා ඵලදායි ලෙස දායක විය හැකි ව්‍යවසායකත්වය පෙරදැරි කරගත් සිසු පරපුරක් සමාජගත කිරීම.

II. කර්මාන්ත බිහි කිරීමට හා නවෝත්පාදන සඳහා අවශ්‍ය ව්‍යවසායකත්ව සංස්කෘතියක් හා මානසිකත්වයක් ගොඩනැගීම.

III. රැකියා අපේක්ෂාවෙන් අධ්‍යාපනය හදාරන්නෙකු ලෙස නොව රටේ පවතින ගැටලුවලට විසඳුම් ලබා දිය හැකි රැකියා නිර්මාණය කරන්නෙකු ලෙස සමාජයට එක් කිරීම.

IV. සමාජයේ කවර හෝ පුද්ගල භූමිකාවක සාර්ථක ලෙස කටයුතු කිරීමේ හැකියාව ලබා දීම සඳහා ව්‍යවසායකත්ව නිපුණතා අත්පත් කර දීම.

V. අභියෝගවලට ප්‍රතිචාර දක්වමින් එය තමාගේ දියුණුවට අවස්ථාවක් කරගත හැකි ශ්‍රී ලාංකිකයෙකු බිහි කිරීම.

**3. සාමාජිකත්වය**

6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණියේ දක්වා ඕනෑම විෂය ධාරාවක් හදාරන සිසුන්ට ව්‍යවසායකත්ව කවයට සම්බන්ධ විය හැකි ය. කවයක සිටිය යුතු අවම සාමාජික සංඛ්‍යාව 15 ක් වන අතර, උපරිම සිසුන් සංඛ්‍යාව 25කි. මෙම උපරිම සංඛ්‍යාවට වඩා සිසු සංඛ්‍යාවක් ඉදිරිපත් වන්නේ නම් ඉහත සීමාවට අනුව විදුහල්පතිගේ අවසරය මත තවත් කව අදාළ පරිදි පිහිටුවාගත හැකි ය. ඒ අනුව පාසලක ව්‍යවසායකත්ව කව එකකට වඩා වැඩි ප්‍රමාණයක් පැවතිය හැකි අතර, එම එක් එක් කවයට තේමාවක් නිර්මාණය කර ගැනීමෙන් එය වඩාත් වර්ණවත් කර ගත හැකි වේ. සාමාජිකයින් සඳහා මාසිකව කණ්ඩායම් රැස්වීම් පවත්වා, කවයේ කටයුතු පිළිබඳ සාකච්ඡා කළ යුතු ය.

**4. නිලධාරි මණ්ඩලය හා කාර්යභාරය**

I. ප්‍රධාන විධායක නිලධාරි - කණ්ඩායම් ප්‍රධානියා වන අතර, බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු හා මෙහෙයවීම.

II. ගණකාධිකාරි - කවයේ ගිණුම් කටයුතු සහ වාර්තා තබා ගැනීම, ලාභ අලාභ ගණනය කිරීම, පිරිවැය ගණනය කිරීම ආදී කටයුතු.

III. අලෙවි කළමනාකරු / අලෙවි සම්බන්ධ නිලධාරි - කවය විසින් සිදු කරන නිෂ්පාදන හෝ සේවාවන්හි ප්‍රචාරණය, අලෙවිය පිළිබඳ කටයුතු හා ඊට අදාළ අනෙකුත් කටයුතු.

IV. නිෂ්පාදන කළමනාකරු - කවය විසින් සිදු කරනු ලබන නිෂ්පාදන හා සේවා කාර්යයන්වල ගුණාත්මක හා ඵලදායී බව පවත්වාගෙන යාම.

සෙසු සාමාජිකයින් ඉහත නිලධාරි මණ්ඩලය සඳහා සහයෝගය ලබා දිය යුතු ය. ප්‍රධාන නිලධාරින් සිව් දෙනාට අමතරව අවශ්‍යතාව අනුව විගණන නිලධාරි/සුපරීක්ෂක වැනි අනෙකුත් නිලධාරින් පත්කර ගත හැකිය. නිලධාරින් හැර කවයෙහි ඉතිරි සිසුන් කාර්යමණ්ඩල සාමාජිකයින් ලෙස සලකනු ලබයි.

- මෙම නිලධාරින් අවුරුද්දක කාලයක් සඳහා වගකීම් දැරිය යුතු අතර ඉන්පසු වෙනත් කණ්ඩායමක් එම තනතුරු සඳහා පත්කළ යුතුය. එහි දී පෙර තනතුරු දැරූ නිලධාරින් කාර්ය මණ්ඩල සාමාජිකයින් ලෙස සලකනු ලබයි.



Scanned with CamScanner

**5. පළාත්/ කලාප සම්බන්ධීකරණ නිලධාරීන් පත් කිරීම සහ විදුහල්පතිගේ කාර්යභාරය**

- ව්‍යවසායකත්ව කව වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පළාත් සම්බන්ධීකරණ කටයුතු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින්ද, කලාප සම්බන්ධීකරණ කටයුතු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද සිදු කළ යුතු වේ. අදාල සංවිධාන කටයුතු සඳහා පළාත්/ කලාප මට්ටමින් සුදුසු නිලධාරියෙකු බැගින් පත්කළ යුතු ය.
- ව්‍යවසායකත්වය තේමා කර ගනිමින් විවිධ තරඟ, ක්‍රියාකාරකම් හා වැඩසටහන් ආදිය පළාත/ කලාපය තුළ සංවිධානය කළ යුතු ය.
- මෙම වැඩසටහන සඳහා විදුහල්පති විසින් පාසලේ ගුරුවරු දෙදෙනෙකු පත් කර ගත යුතු ය.
- ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා නිෂ්පාදන කාර්යයන්හි දී අවශ්‍ය උපකරණ ආදිය තැන්පත් කිරීමටත්, සිසුන්ට ක්‍රියාකාරී අත්දැකීම් ලබා දීමටත් පාසල තුළ සුදුසු ස්ථානයක් වෙන් කර ලබා දිය යුතු වේ. (පාසල තුල වැඩහලක්/ වැඩබිමක් ලෙස කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය සහාය සහ සේවාවන් ලංකා කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාල තුළින් ලබා දීම සිදු වේ.)
- ව්‍යවසායකත්ව ක්‍රියාකාරකම් හි දක්ෂතා පෙන්නුම් කරන සිසුන් අගයමින් ත්‍යාග හා සහතික ආදිය ප්‍රදානය කිරීම සඳහා වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සව අවස්ථාවන්හි දී කටයුතු සම්පාදනය කළ යුතු ය.
- මෙරට කර්මාන්ත ක්ෂේත්‍රය කේන්ද්‍ර කරගනිමින් පාසල් අධ්‍යාපන චාරිකා ආදිය සංවිධානය කළ යුතු ය. (මේ සඳහා අවශ්‍ය මගපෙන්වීම ලංකා කර්මාන්ත සංවර්ධන මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.)
- ව්‍යවසායකත්ව කව භාරව කටයුතු කරන ගුරුවරයා ස්ථානමාරු වන අවස්ථාවක දී ඒ සඳහා වෙනත් ගුරුවරයකු පත් කිරීමට විදුහල්පති විසින් කටයුතු කළ යුතු ය. (එම ගුරුභවතුන් පුහුණු කිරීමේ කාර්ය ලංකා කර්මාන්ත සංවර්ධන මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.)

**6. ව්‍යවසායකත්ව නියමු ලාංඡන හා පදක්කම් ලබා දීම**

සෑම සාමාජිකයකුටම නියමු ලාංඡන සහ ලෝකඩ, රජත, ස්වර්ණ පදක්කම් හා ජනාධිපති පදක්කම ලබා දීමේ ක්‍රමවේදයක් අනුගමනය කෙරේ. මේ සඳහා ශිෂ්‍ය සටහන් පොතක් ද නිකුත් කෙරේ. කවයට අදාළ පදක්කම් ලබා ගැනීම සඳහා තම සාමාජිකයන් තනි තනිවත්/ සාමූහිකවත් ක්‍රියාකාරකම් හි නිරත විය යුතු ය. (මේ හා සම්බන්ධ උපදෙස් හා මගපෙන්වීම් ලංකා කර්මාන්ත සංවර්ධන මණ්ඩලයෙන් නිකුත් කර ඇති " සිසු පරපුර කර්මාන්ත ව්‍යවසායකත්ව සඳහා සවිබල ගැන්වීම " මාර්ගෝපදේශ අත්පොතෙහි අන්තර්ගත වේ.)

**7. ව්‍යාපෘති සඳහා අවසන් අනුමැතිය ලබාදීම**

පාසල් ව්‍යවසායකත්ව කවවල නව යෝජනා මත ඉදිරිපත් කරනු ලබන සියලු ව්‍යාපෘති සඳහා අවසන් අනුමැතිය ලබාදීම, ජාතික පාසලක නම් අධ්‍යාපන අමාත්‍යාංශයේ වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ මත ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද, පළාත් පාසලක නම් කලාප හා පළාත් වාණිජ විෂය භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ මත පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද සිදුකළ යුතු ය.



Scanned with CamScanner

## 8. වෙනත් කරුණු

ඵලදායි ව්‍යවසායකත්ව ක්‍රියාකාරකම් තුලින් කිසියම් ආදායම් මාර්ගයක් සපයා ගැනීමට සිසුන්ට අවකාශ සැලසී ඇති විටෙක ඒ සඳහා ඔවුන් දිරිමත් කිරීමටත්, එම ආදායම ඉදිරි ව්‍යවසායකත්ව කාර්යයන් සඳහා ආයෝජනය කිරීමටත් හැකිවන ආකාරයෙන් මුදල් තැන්පත් කිරීම, පරිශීලනය කිරීම පිළිබඳ කටයුතු සම්පාදනය කිරීම සිදු කළ යුතුව ඇත. මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් මීට සමගාමීව ඉදිරියේ දී හඳුන්වා දීමට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කටයුතු සිදු කරනු ලැබේ.

පාසල් දරුවන් තිරසාර ව්‍යවසායකයින් බවට පත් කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණක් වේ. ඒ අනුව විධිමත් ව්‍යාපාර සැලසුම් සැකසීම සහ වෙනත් මාර්ගෝපදේශ ඇතුළත් පුහුණුව සඳහා "තිරසාර ව්‍යවසායකත්ව සංවර්ධන ප්‍රවේශය" (Sustainable Entrepreneurship Development Access – SEDA) පුහුණු වැඩසටහන යටතේ අවශ්‍ය කටයුතු ලංකා කාර්මාන්ත සංවර්ධන මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. එමෙන්ම සිසුන් අපේක්ෂා කරනු ලබන ක්ෂේත්‍රයකට අනුකූලව අදාළ කර්මාන්ත ශාලාවක වැඩිදුර ව්‍යවසායකත්ව පුහුණුව උපරිම මාස 3ක කාලසීමාවකට යටත්ව ලබා දීමට ද කටයුතු කරනු ඇත. පාසලින් ඉවත් වන විට ව්‍යවසායකයකු වීම සඳහා සුදුසු තත්ත්වයේ පසුවන දරුවෙකුට කාරක ප්‍රාග්ධනය සහ යන්ත්‍රසූත්‍ර ආදිය මිල දී ගැනීමට අවශ්‍යතාව අනුව උපරිම රු. 500,000.00කට යටත්ව (6% ක වාර්ෂික පොළී අනුපාතයක් යටතේ) මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමට ලංකා කාර්මාන්ත සංවර්ධන මණ්ඩලයෙන් අවශ්‍ය කටයුතු සලසනු ලැබේ.

පාසල් කර්මාන්ත ව්‍යවසායකත්ව කව ජාතික වැඩසටහන් පිළිබඳ තොරතුරු සන්නිවේදනයට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශයේ මග පෙන්වීමෙන් යුතුව ත්‍රෛමාසික සඟරාවක් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් නිකුත් කිරීමට ද කටයුතු කරනු ලැබේ. "සිසු පරපුර කර්මාන්ත ව්‍යවසායකත්ව සඳහා සවිබල ගැන්වීම" මාර්ගෝපදේශ අත්පොතට අනුකූලව සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ නීතිරීති සම්ප්‍රදායන්ට අනුකූලව ව්‍යවසායකත්ව කව හා සම්බන්ධ සියලුම කටයුතු සිදු කළ යුතු ය.

දැනට පාසල්හි ක්‍රියාත්මක වන "ව්‍යවසායකත්ව සමාජ" උසස් පෙළ දරුවන්ට පමණක් සීමා වූ වැඩසටහනක් බැවින්, එම වැඩසටහනට සමගාමීව "කර්මාන්ත ව්‍යවසායකත්ව කව" ද ක්‍රියාත්මක කිරීම සුදුසු ය. ඒ අනුව කර්මාන්ත ව්‍යවසායකත්ව කව පිහිටුවීම සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන මෙම චක්‍රලේඛය හොඳින් අධ්‍යයනය කර, 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා පන්ති සඳහා විධිමත් පරිදි ව්‍යවසායකත්ව කව ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර, අනාගතයට වැඩදායි ප්‍රායෝගික කුසලතා අත්පත් කර දෙන විෂය සමගාමී ක්‍රියාකාරකමක් ලෙස සලකා ව්‍යවසායකත්ව කව පාසල් තුළ සක්‍රිය ලෙස පවත්වාගෙන යාමට කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

Jayasundara

ජේ. එම්. තිලකා ජයසුන්දර
ලේකම්

පිටපත් - 1. ලේකම්, කර්මාන්ත අමාත්‍යාංශය.
2. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරු.
3. විගණකාධිපති.
4. සභාපති, ලංකා කර්මාන්ත සංවර්ධන මණ්ඩලය .
5. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්.

Scanned with CamScanner